# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2311/16 – 2022 දෙසැම්බර් 20 වැනි අඟහරුවාදා – 2022.12.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2016/162.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 2224/12 දරන හා 2021.04.20 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් හොරණ, මූණගම, තක්ෂිලා උයන, අංක 199 හි පදිංචි කේ. පියතිලක මහතා (වර්තමාන ලිපිනයඃ අංක 14, ප්‍රයිඩ් ඔෆ් සවුත්, යටියන පාර, කැකණදුර) සහ කොළඹ 03, ගෝල්ෆේස් ටෙරස්, අංක 25 හි පිහිටි ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය අතර පැවැති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 16/2020 දරන හා 2021.03.10 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් කේ. පියතිලක මහතා වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 16/2020 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2023.02.17 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 දෙසැම්බර් මස 08 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 38423 – 18(2022/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**පළමුවන උපලේඛනය**

**"අ" ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

කේ. පියතිලක,
අංක 14,
ප්‍රයිඩ් ඔෆ් සවුත්,
යටියන පාර,
කැකණදුර.

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය.

2021.04.20 දිනැති අංක 2224/12 දරන *ගැසට්* පත්‍රයේ පළ කරන ලද්දවූ ද කේ. පියතිලක වන මම සහ ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය බැඳී සිටින්නාවූ ද 2021.03.10 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අත්සන:

පිටපත: (අනෙක් පාර්ශ්වය) - ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය

(1) ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්ති බලන්න)

(2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවා යෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 12-0318

---

මගේ අංකය: IR/COM/05/2019/60.

**කාර්මික ආරාවුල් - පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2022.10.26 දිනැති හා අංක 2303/21 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.10.06 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 13, කොටහේන, 6 වෙනි පටුමග, අංක 92 හි පදිංචි කාලිමුත්තු ත්‍යාගරාජා මයා සහ තිස්සමහාරාමය, කතරගම පාර, පුංචි අකුරුගොඩ පිහිටි තිස්ස රිසෝට් ප්‍රයිවට් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.11.03 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 දෙසැම්බර් මස 08 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.

IR/COM/05/2019/60.

කාලිමුත්තු ත්‍යාගරාජා මයා.
අංක 92,
6 වැනි පටුමග,
කොටහේන,
කොළඹ 13.

පළමු පාර්ශ්වය

නඩු අංකය: A/65/2022.

සහ

තිස්ස රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
පුංචි අකුරුගොඩ,
කතරගම පාර,
තිස්සමහාරාමය.

දෙවන පාර්ශ්වය

අතර පවත්නා කාර්මික ආරාවුල

**පෙනී සිටීම**: පළමු පාර්ශ්වය වෙනුවෙන් - ඉල්ලුම්කරු පමණි.

දෙවන පාර්ශ්වය වෙනුවෙන් - 01. සමාගමේ නීති නිලධාරිනි වාසනා අලස් මහත්මිය.
02. සහකාර කළමනාකාරිනි මානව සම්පත් අනුෂි උඩලමත්ත මහත්මිය.

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

**ආරාවුල සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයාගේ යොමුව පහත පරිදි වේ:**

**"තිස්ස රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ සේවය කළ කාලිමුත්තු ත්‍යාගරාජා මහතාට 2018 වසරේ පෙබරවාරි සහ මාර්තු මාසයන් සඳහා සේවා ගාස්තු නොගෙවීමෙන් අසාධාරණයක් සිදුවී තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට කුමන සහනයක් හිමිද? යන්නත් පිළිබඳව වේ."**

දෙපාර්ශවය විසින් මීට ඉහතදී කම්කරු දෙපාර්තමේන්තුව වෙත පළමු ප්‍රකාශ ගොනු කිරීමෙන් අනතුරුව ප්‍රථමවරට මෙම නඩුව විභාග කිරීම සඳහා කැඳවූ 2022/11/03 දින පළමු පාර්ශ්වය විසින් ප්‍රස්තුත කරුණ සම්බන්ධයෙන් තම කරුණු ඉදිරිපත් කරන ලදී. ඒ අනුව, පැමිණිලිකරු වන කේ. ත්‍යාගරාජා මහතා 2012/10/15 වන දින සිට ගණකාධිකාරිවරයකු වශයෙන් තිස්ස රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ් හි සේවය කළ බවත් 2017 වර්ෂයේ දෙසැම්බර් මස අගභාගයේදී තමා සන්තකයේ ඇති ගබඩාවේ ද්‍රව්‍යයන්හි තිබිය යුතු ප්‍රමාණයන්ට වඩා අඩුවක් ඇති බව හෝටල් පාලනාධිකාරියට දැන්වූවත් ගබඩා භාරකරු සිය කැමැත්තෙන් ඉල්ලා අස්වී යනතෙක් ඒ සඳහා කිසිදු මාර්ග යක් නොගත් බව කියා සිටී. ඉන් පසු පැමිණිලිකරු ද 2018 වසරේ පෙබරවාරි මස අවසානයේදී තම ඉල්ලා අස්වීම ද දෙවන පාර්ශ්වය වන තිස්ස රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්හි පාලනාධිකාරියට ඉදිරිපත් කළ බවත් ඒ වන විට සිදු කර තිබූ වාර්ෂික විගණන වාර්තාව අනුව ගබඩාවේ ද්‍රව්‍ය සමහරක් අස්ථානගත වී ඇති නිසා තම ඉල්ලා අස්වීම දෙවන පාර්ශ්වය විසින් පිළිනොගත් බවට ප්‍රශ්න කිරීම්වලදී ලිඛිත සාක්ෂි පැමිණිලිකරු විසින්ම ඉදිරිපත් කරන ලදී. එනමුත් තමා 2018 වසරේ මාර්තු මස 31 වන දින සේවයෙන් අස්වූ බවත් එහිදී මාර්තු මාසයේ වැටුපත් මාස දෙකක (පෙබරවාරි සහ මාර්තු) සේවා ගාස්තු සහ පාරිතෝෂිත දීමනාත් දෙවන පාර්ශ්වය විසින් ලබා නොදුන් බවත් පසුව කම්කරු කාර්යාලයට පැමිණිලි කිරීමෙන් අනතුරුව අදළ වැටුපත් පාරිතෝෂිත දීමනාවත් සම්පූර්ණ වශයෙන් ලබා දුන් අතර අදල මාස දෙකෙහි ලැබිය යුතු සේවා ගාස්තු ලබා නොදුන් බවත් පවසා සිටී.

මේ සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය වන තිස්ස රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙනුවෙන් පෙනී සිටි සමාගමේ නීති නිලධාරිනි වාසනා අලස් මහත්මිය ප්‍රකාශකර සිටියේ තම සමාගමේ ගණකාධිකාරිවරයකු වශයෙන් කේ. ත්‍යාගරාජා මහතා 2012/10/15 දින සිට සේවයකළ බවත් 2018 වසරේ පෙබරවාරි මාසයේ ඔහු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලා අස්වීමේ ලිපිය, ඔහු සන්තකයේ පැවති ගබඩාවේ ද්‍රව්‍ය මිලියන එකකට ආසන්න ප්‍රමාණයක් අස්ථානගත වී ඇති බවට වාර්ෂික විගණයේදී තහවුරු වී ඇති බැවින්, තිස්ස රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ් හි

පාලනාධිකාරිය විසින් එම ලිපිය පිළිනොගන්නා බවට ලිඛිතව දැනුම් දී තිබියදීත් පළමු පාර්ශ්වය වන පැමිණිලිකාර කේ. ත්‍යාගරාජා මහතා 2018 මාර්තු 31 වන දින සිට සේවයට නොපැමිණි බැවින් නොදන්වා සේවය හැරගිය පුද්ගලයෙකු ලෙස සලකනු ලැබූ බව ප්‍රකාශ කරන ලදී. තවද, පැමිණිලිකාර පාර්ශ්වය විසින් සඳහන් කළ පරිදි කම්කරු දෙපාර්තමේන්තුව වෙත කරන ලද මුල් පැමිණිල්ල අනුව ඔහුට හිමි වැටුපත් පාරිතෝෂිතයත් සම්පූර්ණ වශයෙන් ගණනය කර ගෙවූ බවත් පළමු පාර්ශ්වය විසින් බේරුම්කරණයට ඉල්ලුම් කරන ලද 2018 වසරේ පෙබරවාරි සහ මාර්තු මාසයන්හි සේවා ගාස්තු නොගෙවූ බවත් ප්‍රකාශ කරන ලදී.

එසේ නොගෙවීමට හේතු විමසීමේදී දෙවන පාර්ශ්වය විසින් දන්වා සිටියේ කේ. ත්‍යාගරාජා මහතා වෙත (පළමු පාර්ශවය) 2012/10/15 වන දින නිකුත්කළ පත්වීම් ලිපියේ දෙවන ඡේදයේ සඳහන් වේතන විස්තර ප්‍රකාරව සේවා ගාස්තුව ගෙවනු ලබන්නේ පාලනාධිකාරියේ පූර්ණ අභිමතයට යටත්ව බවත්, ගණකාධිකාරිවරයා යටතේ පැවති ගබඩාවේ සිදුවී තිබූ අලාභය නිසා ඔහුහට අදාළ මාස දෙක සඳහා සේවා ගාස්තු නොගෙවූ බව ප්‍රකාශ කර සිටින ලදී. මෙහිදී පළමු පාර්ශ්වය වන කේ. ත්‍යාගරාජා මහතා ගබඩාව තමා යටතේ පාලනය වූ බව පිළිගත් අතර, ගබඩාවේ ද්‍රව්‍ය අස්ථානගතවීම සම්බන්ධයෙන් තමා පාලනාධිකාරියට දැන්වූ බව ප්‍රකාශකර සිටි නමුත් ඒ සඳහා වන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර සිටින ලෙස දැන්වූවත් එවැනි කිසිදු ලිඛිත සාක්ෂියක් ඉදිරිපත් කිරීමට ඔහු අපොහොසත් විය.

තමාගේ පත්වීම් ලිපිය ඔහු සතුව ඇත්දැයි විමසීමේදී කේ. ත්‍යාගරාජා මහතා විසින් මුල් පිටපත බේරුම්කරණ අධිකරණයට ඉදිරිපත් කරන ලදී. එහිදී, එම පත්වීම් ලිපියෙහි දෙවන ඡේදයේ වේතන විස්තර සඳහන් අදාළ කොටසෙහි සේවා ගාස්තුව ආයතනයේ පූර්ණ අභිමතය මත සිදුකරන ගෙවීමක් බව පෙන්වා දීමෙන් අනතුරුව කේ. ත්‍යාගරාජා මහතා විසින් එය පිළිගන්නා ලදී. එම නිසා මෙම සේවා ගාස්තුව සේවකයාගේ පරම අයිතියක් නොවන බවත් එය ආයතනයේ පූර්ණ අභිමතය පරිදි ගෙවනු ලබන්නක් බවත් පැහැදිලිකර දෙන ලද අතර ඒ අනුව පළමු පාර්ශ්වය වන කේ. ත්‍යාගරාජා මහතාගේ ඉල්ලීම නිෂ්ප්‍රභා කරන ලදී. මෙහිදී තිස්ස රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්හි සිදුකරන ලද වාර්ෂික විගණන වාර්තාව ඉදිරිපත් කිරීමෙන් පසු පළමු පාර්ශ්වය වන කේ. ත්‍යාගරාජා මහතා නොදන්වා සේවයට නොපැමිණීම ගැනත් සැලකිල්ලට ගැණින.

**නියෝගය**

මෙම බේරුම්කරණ නඩුවට අදාලව දෙපාර්ශ්වයේම එකඟත්වයෙන් එළඹි සමථ යෝජනාව අනුව, පළමු පාර්ශ්වය වන තිස්ස රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ් හි ගණකාධිකාරිවරයකු ලෙස සේවය කළ කේ. ත්‍යාගරාජා මහතා තම ඉල්ලීම වූ ආයතනය විසින් නොගෙවූ 2018 වර්ෂයේ පෙබරවාරි සහ මාර්තු යන මාසයන්හි සේවා ගාස්තු ඔහුගේ පත්වීම් ලිපිය ප්‍රකාරව ආයතනයේ පූර්ණ අභිමතය මත ගෙවන්නක් බැවින් ඔහුගේ ඉල්ලීම නිෂ්ප්‍රභා කිරීමට නියෝග කරන ලදී.

මෙය සාධාරණ හා යුක්තිසහගත නියෝගයක් බව සහතික කරමි.

රමාල් අයි. සිරිවර්ධන,
බේරුම්කරු.

2022 නොවැම්බර් මස 03 වැනි දින දී ය.

EOG 12-0319